# අවුරුදු 70ක නිදහසින් පසු ශ්‍රී ලංකාවේ

# වටිනාකම් සහ ආකල්ප පිළිබඳ මත සමීක්ෂණය

## සාරාංශය

1948

70

2018

2019 පෙබරවාරි

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය - සෝෂල් ඉන්ඩිකේටර්

# අන්තර්ගතය

**පිටු අංක**


**හැඳින්වීම** ........................................ 1

**ක්‍රමවේදය** ........................................ 3

**සාරාංශය** ........................................ 4

# හැඳින්වීම

ශ්‍රී ලංකාව අවුරුදු 70ක නිදහස භුක්ති විඳීමට සමගාමී ව ආණ්ඩුකරණය, ප්‍රජාතන්ත්‍රවාදය, දේශපාලන දෘෂ්ටිවාදය, ජාත්‍යන්තර සබඳතා, සාමය සහ සංහිඳියාව යන ක්ෂේත්‍රවලට අදාළ ව මහජන මතය හුවා දැක්වීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ. විශේෂයෙන් තරුණ ප්‍රජාවගේ කැමත්ත සහ ඡන්ද නියෝජිතයන් අතර පවතින ප්‍රජාතන්ත්‍රවාදී දුරස්ථභාවය මෙම අධ්‍යයනයෙන් අවධාරණය කෙරේ. ශ්‍රී ලංකාව නිදහස ලබා අවුරුදු 100ක් සමරන විට 21 වන සියවසේ උපන්නන් යටතේ රටේ ආණ්ඩුව සහ රාජ්‍ය පාලනය කිනම් මුහුණුවරක් ගනීදැයි නිර්ණය කිරීම මෙම සමීක්ෂණයේ මූලික අරමුණ වේ.

ආසියාවේ පැරණිතම ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන්ගෙන් එකක් ලෙස සැලකෙන ශ්‍රී ලංකාව 1948 සිට දේශය ගොඩනැගීම සඳහා අවශ්‍ය වන්නා වූ මාර්ගය තමා විසින් ම සකසා ගන්නා ලදී . මේ ක්‍රියාවලිය අතරතුර ජයග්‍රහණයන් මෙන් ම අභියෝග රාශියකට ද මුහුණ දීමට සිදු විය. එක් අතකින් දකුණු ආසියාතික අසල්වැසියන් හා සැසඳීමේ දී සාපේක්ෂ ව ඉහළ සමාජ දර්ශක පවත්වා ගැනීමට ශ්‍රී ලංකාව සමත් වීම විශේෂත්වයකි. අනෙක් අතට සිවිල් ගැටුම්කාරී තත්ත්වය (දකුණේ මාක්ස්වාදී පුනර්ජීවය) සහ දශක තුනකට ආසන්න දීර්ඝ කාලයක් තිස්සේ පැවතුණු දිගු සිවිල් ගැටුමකින් (රාජ්‍ය සහ දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානය - ඛගඔගඔගෑග අතර පැවති වාර්ගික ගැටුම) රටක් ලෙස විවිධ දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදු විය. 2009 මැයි මස සිවිල් ගැටුම අවසන් වුව ද වසර ගණනාවක් තිස්සේ විඳි පීඩාව සහ සිදු වූ විනාශයට ස්ථිර විසඳුමක් ලබා දීමට රට තවමත් අරගල කරයි. ශ්‍රී ලංකාව නිදහස ලබා අවුරුදු 70ක් සැපිරීම සැමරුව ද තව දුරටත් ජනවාර්ගිකමය දේශපාලනයට යොමු වන බව පැහැදිලිව පෙනෙන දෙයකි . මෙහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රජාව අතර අක්‍රමවත් ප්‍රචණ්ඩත්වයක් දැකිය හැක. පුළුල් ජනතා සහභාගිත්වයක් සහිත ව අඛණ්ඩව මැතිවරණ පවත්වන, බාධාවලින් තොර, ප්‍රජාතන්ත්‍රවාදී ඉතිහාසයක් හිමි වුව ද, ඒකාධිපති නායකත්වයට ඇති ආකර්ෂණය පහව ගොස් නැති බව පෙනෙන්නට ඇත.

රටේ ව්‍යවස්ථාව ප්‍රතිසංස්කරණය කිරීමට කොතරම් ප්‍රයත්න දැරුව ද පසුකාලීන ව එම උත්සාහයන් ව්‍යර්ථ වී ඇත. ගෝලීයකරණය, නැගී එන ගෝලීය මෙන් ම කලාපීය බලවතුන් සහ වෙනත් විවිධ දේශපාලන හා ආර්ථික යථාර්ථයන් හේතුවෙන් ශ්‍රී ලංකා සමාජය ශීඝ්‍ර පරිවර්තනයකට ලක්වෙමින් පවතී. වර්තමානයේ දේශපාලන පක්ෂ වල හැසිරීම මෙන්ම ඔවුන් ඉදිරිපත් කරනු ලබන ප්‍රතිපත්තීන් ද, සමකාලීන ශ්‍රී ලංකාව මුහුණ දී ඇති උග්‍ර අභියෝගයන්ට විසඳුම් සෙවීමට තරම් ප්‍රමාණවත් නොවේ.

මෙම පසුබිම තුල ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගේ මතය පිළිබඳ තක්සේරුවකට එළැඹීමට සහ ප්‍රජාතන්ත්‍රවාදයට සහ පාලනයට සම්බන්ධ ප්‍රධාන කරුණු පිළිබඳ ඔවුන්ගේ ස්ථාවරය විමසීම උදෙසා මෙම සමීක්ෂණය පවත්වන ලදී. මෙම අධ්‍යයනයේ අරමුණ වනුයේ පවත්නා දේශපාලන සංවාද වැඩි දියුණු කරමින්, එතුලින් විවිධ කණ්ඩායම් අතර පවතින විවිධ ගතිකාවන් අවබෝධ කරවීමෙන්, ප්‍රතිපත්ති සම්පාදකයන්ට බලපෑම් කිරීම මගින් සුදුසු ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණයන් වෙනුවෙන් බලධාරීන්ට සහාය දැක් වීමය. නව ව්‍යවස්ථාවක් සඳහා කෙටුම්පත් සකස් කිරීමට රට අදහස් කරන විටක දී, මහජනතාවගේ

© 2019 SOCIAL INDICATOR

ආකල්ප සහ හැඟීම පිළිබඳ සිතුවමක් මෙම අධ්‍යයනය සපයයි. විවිධ පාර්ශ්වකරුවන්ගෙන් විවිධ අර්ථ නිරූපණ ලබා ගැනීමේ අරමුණින්, මෙම අධ්‍යයනයේ මූලික වාර්තාව, සමීක්ෂණයේ සොයාගැනීම් සවිස්තරාත්මකව ගෙනහැර දක්වයි. විශේෂඥ විශ්ලේෂණ සහ අර්ථ නිරූපණ ඉදිරි මාසවල දී ඉදිරිපත් කිරීමට ීදජස්ක ෂබාසජ්එදර අරමුණු කරයි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සමීක්ෂණ අංශය වන සෝෂල් ඉන්ඩිකේටර් විසින් මෙම සමීක්ෂණය සිදු කරන අතර 1999 වසරේ සිට සමාජීය සහ දේශපාලනික කරුණු සම්බන්ධයෙන් පුළුල් පරාසයක මහජන මත විමසුම් පවත්වනු ලබයි. මෙමගින් සාමාන්‍ය ජනතාවට, තමන්ගේ සැලකිල්ලට භාජනය කල යුතු ගැටලු සම්බන්ධයෙන් ප්‍රකාශ කිරීමට අවශ්‍ය වන්නා වූ මාධ්‍යයක් සපයයි. ආචාර්ය ප්‍රදීප් පීරිස්, එම්. ක්‍රිෂ්ණමූර්ති සහ සකිනා මොයිනුඩීන් යන අයගෙන් සමීක්ෂණ කණ්ඩායම සමන්විත වේ. සමීක්ෂණ සහාය හසිනි ලේකම්වසම්ගෙන් වූ අතර දත්ත විශ්ලේෂණයෙන් ශෂික් ධනුෂ්ක සහාය විය. මෙම අධ්‍යයනය පුරාවට වටිනා දායකත්වයක් සහ මඟ පෙන්වීමක් ලබා දුන් ආචාර්ය පාක්‍යසෝති සරවණමුත්තු මහතාටත් අධ්‍යයනය සම්පූර්ණ කිරීමට මූල්‍ය ආධාර සැපයූ නෝර්වේ රාජ්‍යයේ විදේශ කටයුතු අමාත්‍යාංශයටත් සෝෂල් ඉන්ඩිකේටර් ස්තුතිය පළ කිරීමට කැමති ය.

**ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඇති සම්පූර්ණ වාර්තාව ලබා ගැනීම සඳහා මෙතනින් ප්‍රවේශ වන්න.**

© 2019 SOCIAL INDICATOR 

# ක්‍රමවේදය

මෙම සමීක්ෂණය කරන ලදදේ අර්ධ ව්‍යුහගත ප්‍රශ්නාවලියක් මගින් වන අතර සෑම දිස්ත්‍රිකයක්ම නියෝජනය වන ආකාරයන් ප්‍රතිචාරකයන් 2300 දෙනෙක් සිංහල සහ දෙමළ භාෂා දෙකෙන්ම සම්මුඛ සාකච්ඡා පැවැත්වීමට යොදා ගන්නා ලදී. සමීක්ෂණය සිදුකරන ලද්දේ සරළ සම්භාවී නියදි ක්‍රමයට අනූව වන අතර නියදි ප්‍රමාණය තෝරා ගන්නා ලද්දේ 95% විශ්වාසනීය මට්ටමේ සහ 2% දෝෂ අන්තයක් තුළ ප්‍රථිඵලයන් ලබා ගැනීමේ අරමුණෙන් දිස්ත්‍රික්, ජනවාර්ගික සහ ජනගහනයේ වයස් සීමාව සැලකිල්ලට ගනිමින්ය. සමස්ථ ක්ෂේත්‍ර අධ්‍යනය සිදු වූයේ අගෝස්තු 10 දින සිට ඔක්තෝබර් 10 දක්වාය. සිංහල, දෙමළ සහ මුස්ලිම් භාෂා තුනෙන් සමන්විත, ස්ත්‍රී සහ පුරුෂ ක්ෂේත්‍ර පර්යේෂකවරු 60 දෙනෙකු අධ්‍යනයට සහභාගී විය. දත්තවල ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා සමීක්ෂයන් ක්ෂේත්‍රයේ පර්යේෂණ කරන අතරතුර ඔවුන් නිරීක්ෂණය කිරීම සහ ස්ථාන නිරීක්ෂණයන් මෙන් පසු විමර්ෂණයන් සිදු කරන ලදී. දත්තයන්හි නිවැරදිභාය පිළබිගු කිරීම සඳහා දිස්ත්‍රික්ක ජනවර්ගය, වයස් ප්‍රමාණය අනූව දත්තයන්හි බර තැබීම සිදු කරන ලදී.

## සාරාංශය

- ශ්‍රී ලාංකිකයන්ගෙන් පැහැදිලි බහුතරයක් (77.5%) වංචා දූෂණ හානිදායක දෙයක් වන අතර එය සම්පූර්ණයෙන්ම මුලිනුපුටා දැමිය යුතු බවත් විශ්වාස කරන බැව් පෙනේ.
- සංවර්ධනය පිළිබඳ සැලකීමේදී අධ්‍යාපන ක්ෂේත්‍රය, කෘෂිකාර්මික ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සහ සෞඛ්‍ය යන ක්ෂේත්‍ර වලට ජාතික අයවැය තුළින් මූල්‍ය සම්පත් වෙන් කිරීමේදී ප්‍රමුඛතාව හිමි වියයුතු යුතු බව බොහෝ ශ්‍රී ලාංකිකයෝ විශ්වාස කරති.
- අනාගතයේ වඩාත් හොඳ රැකියා අවස්ථා ළඟා කරගැනීම සඳහා පාසල් විෂය නිර්දේශ තුළ ඉංග්‍රීසි භාෂාවට වැඩි ඉඩක් ලබා දියයුතු බවට 83.2% ක ශ්‍රී ලාංකිකයන්ගේ මතය වේ.
- පොදුවේ මෙරට නීතිය හා සාමය ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳව ශ්‍රී ලාංකිකයන්ගෙන් 59.2% ක පිරිසක් සෑහීමකට පත් නොවන බව ප්‍රකාශ කරයි. ජනවාර්ගික දෘෂ්ටි කෝණයකින් ගත් කළ මේ අදහස වැඩිපුරම දරන්නේ සිංහල ප්‍රජාවය (64.3%).
- ශ්‍රී ලාංකිකයන්ගෙන් අති බහුතරයක් (70.9%) ශ්‍රී ලංකාව තුළ මරණීය දණ්ඩනය ක්‍රියාත්මක කිරීම අනුමත කරයි.
- විවිධ සමාජ මාධ්‍ය ජාලා (Facebook, Twitter, YouTube, Viber, WhatsApp වැනි ) භාවිතය සම්බන්ධයෙන් ශ්‍රී ලාංකිකයන්ගෙන් බහුතරයක් 50.8% ක් කිසිදු දිනෙක මෙවැනි සමාජ මාධ්‍ය භාවිතා කර නොමැති බව ප්‍රකාශ කරයි. කෙසේ වෙතත් වැඩිහිටි ජනගහනය 13.3% හා සැසඳීමේදී තරුණ ජනගහනය 57.7% ක් මෙම සේවා දෛනිකව වැඩි වශයෙන් භාවිතා කරන බව දැකගත හැකිය.
- ශ්‍රී ලාංකිකයන්ගෙන් බහුතරයක් (53.3%) පශ්චාත් යුධ ශ්‍රී ලංකාවේ සංහිඳියාව පිළිබඳ වර්තමාන ආණ්ඩුවේ ක්‍රියාකාරීත්වයෙහි ප්‍රගතිය සම්බන්ධයෙන් තෘප්තියට පත් නොවන බව ප්‍රකාශ කරන අතර, මෙම මතය වැඩි වශයෙන් දරනු ලබන්නේ තරුණ ජනගහනයයි (60%).
- ශ්‍රී ලංකාවේ දශක තුනක් පැවති සිවිල් ගැටුම්කාරී තත්ත්වය තුළ ඊට සම්බන්ධ වූ සියළුම පාර්ශවයන් විසින් මනුෂ්‍යාත්වයට එරෙහි අපරාධ කළ බවට එල්ල වූ චෝදනා සම්බන්ධයෙන් ඇත්ත දැනගැනීමේ අයිතියක් අපරාධ වලට ලක්වූවන්ට මෙන්ම පොදුවේ සමාජයටම වැදගත් බව ශ්‍රී ලාංකිකයින්ගෙන් 72.4% ක් විශ්වාස කරයි. කෙසේ වෙතත්, ජනවාර්ගික දෘෂ්ටි කෝණයෙන් ගත් කළ මේ අදහස වැඩිපුරම විශ්වාස කරන්නේ බහුතර සිංහල ප්‍රජාවට වඩා සුළුතර ප්‍රජාව බව

පැහැදිලිය. තවද, අතීතයේ පැවති සිවිල් නොසන්සුන්කාරී තත්ත්වයන් හේතුවෙන් විපතට පත් වූවන්ට හානිපූරණය කිරීම /සහනයක් වීම සම්බන්ධයෙන් ප්‍රතිචාරකයන්ගේ මතයේද මෙම රටාව දැකගත හැකිය.

❖ රට පාලනය කිරීමේ ක්‍රමවේදය සම්බන්ධයෙන් ශ්‍රී ලාංකිකයින්ගෙන් බහුතරයක් 74% කගේ මතය වන්නේ ප්‍රජාතන්ත්‍රවාදය අන් සියළු විකල්පයන්ට වඩා පාලනය සඳහා සුදුසු බවයි.

❖ සෞඛ්‍ය සේවය තුළ පෞද්ගලික අංශයේ මැදිහත් වීම වැඩිවීම ශ්‍රී ලාංකිකයින්ගෙන් වැඩි ප්‍රතිශතයක් එකඟ නොවන අතර, මෙම මතය වැඩිපුරම දක්නට ඇත්තේ මුස්ලිම් ප්‍රජාව අතරය (61.3%). අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ පෞද්ගලික අංශයේ මැදිහත් වීම සම්බන්ධයෙන්ද මෙම රටාව දැකගත හැකිය.

❖ බහුතරයක් ශ්‍රී ලාංකිකයන් (50.2%) විශ්වාස කරන අන්දමට රජයේ වියදම් වැඩි වීමට බලපෑමක් වුවද රාජ්‍ය සේවකයින් ප්‍රමාණය අඩු නොකළ යුතුය. මෙහි සැළකිය යුතු කරුණක් වනුයේ මෙම අදහස වැඩිපුරම දරන්නේ වැඩිහිටි ජනගහනයට සාපේක්ෂව (49.6%) තරුණ ජනගහනය (51.3%) වීමයි.

❖ ව්‍යවස්ථාව තුළ ආගමට තැනක් ලබාදීම පිළිබඳ විමසීමේදී රටේ බහුතරයකගේ ආගමට ප්‍රමුඛස්ථානයක් ලබාදීම ගැටළුවක් නොවන බව බහුතරයක් විසින් ප්‍රකාශ කරන ලද අතර, 36.5% ක ප්‍රමාණයක් පැවසුවේ සෑම පුරවැසියෙකුගේම සමානාත්මතාවයට ඇති අයිතිය පවත්වාගෙන යෑම සඳහා කිසිදු ආගමකට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් ප්‍රමුඛස්ථානයක් නොදිය යුතු බවයි. මෙහිදී සැළකිය යුතු කරුණක් වනුයේ රටේ බහුතරයකගේ ආගමට ප්‍රමුඛස්ථානයක් ලබාදීම ගැටළුවක් නොවන බව ප්‍රකාශ කරන ලද්දේ සිංහල ප්‍රජාව වන අතර, සෑම පුරවැසියෙකුගේම සමානාත්මතාවයට ඇති අයිතිය පවත්වාගෙන යෑම සඳහා කිසිදු ආගමකට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් ප්‍රමුඛස්ථානයක් නොදිය යුතු ප්‍රකාශ කරන ලද්දේ සුළුතර ප්‍රජාව වීමයි.

❖ විශේෂයෙන්ම සෑම පුරවැසියෙකුගේ සමානාත්මතාවයට ඇති අයිතිය පවත්වාගෙන යෑම සඳහා කිසිදු ආගමකට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් ප්‍රමුඛස්ථානයක් නොදිය යුතු බව වැඩි වශයෙන් විශ්වාස කරනුයේ තරුණ ජනගහනයි (42%).

❖ වඩාත් කැමති පාලන ක්‍රමය ලෙස පැහැදිලි බහුතරයක් (84.2%) ප්‍රජාතන්ත්‍රවාදයට සහාය දැක්වූ අතර, පාර්ලිමේන්තුව සහ මැතිවරණයන් වල බලපෑමකින් තොරව, තීරණ ගත හැකි ශක්තිමත් නායකයකු රට පාලනය කිරීම සහ පාර්ලිමේන්තුව සහ මැතිවරණයන් වල බලපෑමකින් තොරව, තමන් සිතන පරිදි රටට වඩාත් සුදුසු යැයි විශ්වාස කරන තීරණ ගත හැකි විශේෂඥයන් රට පාලනය කිරීම යන විකල්ප වලටද සැළකිය යුතු මට්ටමේ සහයක් තිබූ බව සඳහන් කළ යුතුය.

- අනාගතය පිළිබඳ කල්පනා කිරීමේදී, ශ්‍රී ලංකාව ආදර්ශයක් හැටියට අනුගමනය කළ යුතු රට වශයෙන් 24.7% ක් ජපානයත්, 19.5% ක් සිංගප්පූරුවත් ප්‍රකාශ කර ඇත. උඩරට දෙමළ ප්‍රජාව සහ දෙමළ ප්‍රජාව වැඩි වශයෙන් ඉන්දියාවත්, මුස්ලිම් ප්‍රජාව වැඩි වශයෙන් සෞදි අරාබියත් ප්‍රකාශ කර ඇත. ඇමෙරිකාව ලොව බලවත්ම රට ලෙස 52.5% ක් ද, ලංකාව හැරුණු කොට තමන් ජීවත් වීමට කැමතිම රට ලෙස බහුතරයක් ඕස්ට්‍රේලියාවද දක්වා ඇති නමුත් ලංකාව විසින් ආදර්ශයට ගතයුතු රටක් ලෙස බටහිර රටවල් ඉතා පහත් මට්ටමක තිබීම සැළකිය යුතු කරුණකි.

The Centre for Policy Alternatives (CPA) is an independent, non-partisan organisation that focuses primarily on issues of governance and conflict resolution. Formed in 1996 in the firm belief that the vital contribution of civil society to the public policy debate is in need of strengthening, CPA is committed to programmes of research and advocacy through which public policy is critiqued, alternatives identified and disseminated.


Address: 6/5, Layards Road, Colombo 5, Sri Lanka.
Telephone: +94(11)2081384-6
Fax: +94(11)2081388
Web: www.cpalanka.org
Email: info@cpalanka.org


Making Social Research Count

Social Indicator (SI) is the survey research unit of the Centre for Policy Alternatives (CPA) and was established in September 1999, filling a longstanding vacuum for a permanent, professional and independent polling facility in Sri Lanka on social and political issues. Driven by the strong belief that polling is an instrument that empowers democracy, SI has been conducting polls on a large range of socio-economic and political issues since its inception.


Address: 105, 1/1, Fifth Lane, Colombo 03
Telephone: +94(11)2370472/4
Web: http://cpalanka.org/survey-research/